ආඛ්‍යාන narrations
**Volume 05 | Issue 01 | 2020 | Article 02**

**ISBN 2478-0642**

On-line Refereed Journal of the Center for Indigenous Knowledge and Community Studies
Sabaragamuwa University of Sri Lanka

Follow this and additional works at: www.sab.ac.lk
e-mail: akyanaeditor@ssl.sab.ac.lk

CC BY NC ND

# බෞද්ධ දර්ශනයට පටහැණි ශ්‍රී ලාංකේය ශාන්තිකර්ම ආශ්‍රිත වත්පිළිවෙත්

කේ. එම්. සමන් කුමාරතුංග[3][4]
kumarathungasaman@gmail.com

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ අතීතයේ සිට පැවත එන ශාන්තිකර්ම ආශ්‍රිත වත්පිළිවෙත් කොතෙක් දුරට මිත්‍යා දෘෂ්ටිකවේ ද? යන්න මෙයින් විමසුමට ලක් වේ. සමස්තයක් වශයෙන් සලකා බලන කල නිර්මල බුද්ධ ධර්මය සහ ප්‍රතිපත්ති පූජා සමග එකග නොවන, එහෙත් බෞද්ධ වත්පිළිවෙත් හා සමගාමීව සිරිලක බෙහෙවින් ප්‍රචලිත තොවිල් වත්පිළිවෙත් (බෙන්තරගේ, 1998,40-45 පිටු) සමුදායක් හඳුනාගත හැකිය. මේවා බෞද්ධ දර්ශනයට පටහැණි විවිධ මිත්‍යා බව පසක් වේ. සියලු යාග ක්‍රම යක්ෂ, දේව, ග්‍රහ යනුවෙන් අංශත්‍රයකට අයත් වේ. මේවායෙහි යාග සාහිත්‍යය, පූජාවිධි ක්‍රම සහ පාරිහාරික පිළිවෙත්වල බෞද්ධ නැඹුරුව කෙලෙස ගොඩනැගුණි ද? යන්න විමර්ශනය කෙරේ. ශ්‍රී ලංකාවේ යක්තොවිල් ක්ෂේත්‍රයට පොදු වූ ප්‍රධානතම යක්ෂ විශ්වාස පංචයකි. ඔවුන් හඳුන්වනු ලබන්නේ සමාගමේ යක්ෂයින් ලෙස ය. එනම් මහසොහොනා, කලුයකා, රීරියකා, තොටයකා, අබිමානා යනුවෙන් මේ හැර මදන, ඔඩ්ඩිස, ගොපලු, ප්‍රේත, බහිරව, පිල්ලු, කලුකුමාර, මලයකුන්... වශයෙන් අවශේෂ යක්ෂ පිරිසක් ද වෙත්. මොවුන් පුද ලබන ශාන්තිකර්ම ලෙස මහසොහොන් සමයම, ගොපලු සමයම, කලුකුමාර සමයම, රිද්දියාගය, සූනියම් යාගය, සන්නියකුම, පංච පිදෙන්න සහ දරුහැව තොවිල් මෙන්ම රීරි බලිය, කටිනා බලිය, මදනයක් බලිය, යක්ෂගිරි බලිය, ඔඩ්ඩිස බලිය, කලුකුමාර බලිය යනුවෙන් මෙහිලා කිහිපයක් දැක්විය හැකි අතර උඩරට, පහතරට සහ සබරගමුව යනුවෙන් ප්‍රධානතම සම්ප්‍රදායත්‍රයක් (කුමාරතුංග, 2006,vii-සං පිටු) යටතේ මේවා හඳුනාගත හැකි ය. උපලක්ෂිත යාග පද්ධතියේ විවිධ අන්දමේ සාහිත්‍යය සමීක්ෂාවේ දී ඒවා ප්‍රාග් - බෞද්ධ ඇදහිලි සහ බෞද්ධ නොවන භාරතීය සංකල්ප අනුසාරයෙන් පැවත එන විශ්වාස මූල බව අනාවරණය වේ. වර්තමානයේ බෞද්ධයින්ගේ පාරිහාරික වත්පිළිවෙත් හා සමගාමී වූ එම චාරිත්‍ර යමෙකුට

---
[3] ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය
[4] භාෂා සංස්කරණය - නාලක ජයසේන

බෞද්ධ වත්පිළිවෙත් යැයි නිරායාසයෙන් ඒත්තු ගැන්වෙන ප්‍රබල ගුණයකින් යුතු බවක් දිස් වුවද ඒවා බෞද්ධ දර්ශනයට හාත්පස පටහැණි වූ නොදැහැමි ඇදහිලි සංකීර්ණයක් යැයි අපගේ ප්‍රබල විශ්වාසය වේ. මෙවැනි ගුඪ විශ්වාසවලින් ආවෘත වූ ජන මනස තුළ ව්‍යාකූල නොවූ නිරවුල් බුද්ධි ගෝචර ආධ්‍යාත්මික වන්දනා හා වත්පිළිවෙත් ක්‍රම පිළිබඳ තර්ක බුද්ධිය ගොඩනැගීමත් මිත්‍යා දෘෂ්ටික මතවාද බැහැර කිරීමත් මෙහි අරමුණු වේ. ශාන්තිකර්ම පාරම්පරිකව පවත්වාගෙන එන අප විසින් තෝරාගත් ප්‍රශස්තතම යාග ඇදුරන්ගේ යාග නිරීක්ෂණය, ඔවුන්ගේ අත්පිටපත් පරිශීලනය, ඔවුන් සමග සම්මුඛ සාකච්ඡා පැවැත්වීම මගින් දත්ත රැස් කිරීම සහ දිවයිනේ නන්දෙස යාග සහභාගිත්ව අධ්‍යයනය ඒ හා බැඳි මූලාශ්‍රය ග්‍රන්ථ සහ ද්විතීයික මූලාශ්‍රය ග්‍රන්ථ පරිශීලනය, විවිධ යාග පිළිබඳ ශාස්ත්‍රීය ලිපි සහ ශ්‍රව්‍ය දෘශ්‍ය සංයුක්ත තැටි පරිශීලනය මගින් කළ ගුණාත්මක හා ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණ මෙහිදී මූලාශ්‍රය කොට ගැනිණි.

**ප්‍රමුඛ පදඃ** තොවිල්, යාග සාහිත්‍යය, වත්පිළිවෙත්, සමාගමේ යක්ෂයින්

## අන්තර්ගතය

ශාන්තිකර්ම වත්පිළිවෙත්වලින් ආශිංසන සහ සහනය ලබාගැනීම මූලික පරමාර්ථය වේ. එහි කායික මානසික සුවය අපේක්ෂාව මෙන්ම සෞභාග්‍ය, සශ්‍රිකත්වය අපේක්ෂාව ද ප්‍රධානතම වූවකි. මාංශ බලි, රීරි බලි, පුළුස්සාලනු ලබන සත්ත්ව මාංශ, මත්ශ්‍ය කොටස් හෙවත් ගොඩ දිය මස්, රා, අරක්කු, කංසා, අබිං, ඇටෑට්, විළඳ, බත් හත්මාලු, ක්ෂීර, පැණි, ක්ෂීර පායාෂ, ගිතෙල් පායාෂ, මුරුතැන්, පළතුරු, කැවිලි යනාදී විවිධ අන්දමේ පූජා පැවැත්වීම ශාන්තිකර්ම ක්ෂේත්‍රයට අයත්වේ. මේ හැරුණුවිට බොහෝ පූජා ද්‍රව්‍යය සහ ඊට ආවේණික වත්පිළිවෙත් සමුදායක් මතුවට මෙහි සාකච්ඡා කෙරේ. මෙලොව දිවිය උපරිම සැපෙන් ගත කිරීමට අපේක්ෂිත කාමසුඛල්ලිකානු වත්පිළිවෙත් විවිධ අන්දමෙන් පැවැත්වීම වත්මන් බෞද්ධ අබෞද්ධ සැම ජන කොට්ඨාසයක් අතරෙහිම පවතී. මේ ගැන විග්‍රහයට ප්‍රථම මූලික බුදු දහමේ අපේක්ෂාව සංක්ෂිප්තව මතුවට දක්වා තිබේ.

## බුද්ධ ධර්මයේ මූලික අපේක්ෂාව

බුද්ධත්වයෙන් පසුව ප්‍රථම ධර්ම දේශනාවෙන් බුදු දහමේ සාරාංශය ප්‍රකට වෙත්. එනම්, දුක්ඛ සත්‍යය, සමුදය සත්‍ය, නිරෝධ සත්‍ය, මාර්ග සත්‍යය හෙවත් චතුරාර්ය සත්‍යය අවබෝධ කරවීමට කළ පැහැදිලි කිරීම් ය. ගැඹුරු දාර්ශනික අර්ථයකින් යුක්ත ''දුක්ඛ'' යන්නෙහි අර්ථය සැකෙවින් දක්වතොත්, මානසික හා ශාරීරික වේදනාව, අසහනය, සන්තාපය, පීඩනය මෙන්ම අනිත්‍යය හා අනාත්මය විනිවිද දැකීම මගින් පහළ වන ශූන්‍යතාව පිළිබඳ හැඟීම් ද එහි උගන්වනු ලබත්. තවදුරටත් කිවහොත් ''සංසාරික ජීවිතය හැම අතින් ම නිස්සාර වූ අස්ථිර වූ සැපයෙන් තොර වූ නොවැළැක්විය හැකි විපරීතවන තත්ත්වයකි'' යන සියුම් දර්ශනය ''දුක්ඛ'' යන්නෙහි ගැබ්ව පවතී.

එමෙන්ම ''දුක්ඛ'' සත්‍යයේ ''අනිත්‍ය, දුක්ඛ, අනාත්ම'' යන මේ ත්‍රිලක්ෂණ ගැඹුරින් හදාළ යුතු වේ. අනිත්‍ය හෙවත් වෙනස්වීම නිසා හටගන්නා දුක ''ජාති, ජරා, ව්‍යාධි, මරණ'' යනාදි විපරිණාම දුක්ඛ වේ. මේ අනුව වෙනස් නොවන කිසිවක් නොමැත. වෙනස්වීම, දිරා යෑම, විනාශය යන ධර්මතාවයට ඇතුළත් නොවන්නක් නොමැත යනු එහි කෙටි හැඳින්වීම වේ. ඉපදීම, ජරාව, ව්‍යාධිය, මරණය හා තමා අපේක්ෂා කරන දේ නොලැබීම, කම්සැප ගිලිහී යෑම, ප්‍රියයන්ගෙන් වෙන්වීම, අප්‍රියයන් හා එක්වීම ''දුක්ඛ දුක්ඛ'' යන්නට අයත් වේ. සියල්ල වෙනස්වන හෙයින්, ශූන්‍ය හෙයින් කිසිවක් තුළ නිත්‍ය ධර්මයක්, එනම් ආත්මයක් නොමැත. මිනිසා, සතා, ගහකොළ සියල්ල විවිධ අයුරින් හැඳින්වෙන දේ සතර මහා භූත හෙවත් ආපෝ, තේජෝ, වායු, පඨවි, ආකාශ යන මහා භූතවලින් හෙවත් පරමාණු අංශු මාත්‍රවල එක්වීමකින් හටගන්නා දෙයකි. මේ ධාතුවලින් තොරවූ ආත්මයක් නැත යන ඉගැන්වීම මෙහි අන්තර්ගත වේ. දුක නැතිකොට සැප ලබාගැනීමේ මාර්ගයක් ද එහි ගැබ්ව පවතී. බුදුරදුන් පිළිබිඹු කෙරෙන පිළිමවල උන්වහන්සේ ඉතා ප්‍රීතිමත්, උපශාන්තව දක්වා තිබීමෙන් අපේක්ෂා කරන්නට ඇත්තේ උන්වහන්සේ දුක්ඛවාදියෙකු නොවන නිසා ය. වෛද්‍යවරයාගේ කාර්යය වන්නේ අප්‍රසන්න වූ පිළිකුල් සහගත වූ රෝගය සොයා රෝග නිධානය මතුකරගෙන ඊට යුක්තියුක්ත ඖෂධ ප්‍රතිකාර යොදා සුවපත් කිරීම වන්නා සේම දෙවන සත්‍යය හෙවත් සමුදය සත්‍යයෙන් දුකට හේතුව පෙන්වා දෙයි. මේ හේතුව ප්‍රධාන වශයෙන් තණ්හාවයි. එය ඉන්ද්‍රිය පිනවීමේ කාම තණ්හා, සසර සැරිසැරීමේ භව තණ්හා සහ ජීවිතය ගැන කලකිරී භවය නැතිකර දැමීමේ දැඩි ආශාව විභව තණ්හා යනුවෙනි. මෙම තණ්හා අවිද්‍යාව හෙවත් නොදන්නා තත්ත්වය මත හටගන්නක් වේ. මෙහි දැක්වූ සමුදය සත්‍යයට පසුබිම් වූ එහි සන්දර්භය ගැබ්ව පවතී. සෑම දෙයකටම හේතුවක් ඇත. නොමැතිනම් හේතු ; සමුදායක් ඇත.

තුන්වැනි මාර්ග සත්‍යයෙන් උගන්වන්නේ දුකින් මිදීමට තිබෙන මාර්ගය යි. එය උත්තරීතර පරම තත්ත්වය හෙවත් නිර්වාණය යි. එය ගැඹුරින් අධ්‍යයනය කර වටහාගත යුතු වේ. සතරවැනි ආර්ය සත්‍යය නිර්වාණයට මාර්ගය පහදයි. එය ආර්ය අෂ්ටාංගික මාර්ග නමිනි. කාමසුඛල්ලිකානු යෝගය සහ අත්තිකිලමථානු යෝගය යන අන්ත දෙකින් මිදුණු මධ්‍ය මාර්ගය යි. මෙය පඤ්ඤා, ශීල, සමාධි යන අංශ තුනට බෙදන ලද ගුණධර්ම අටකින් හෙවත් ආර්ය අෂ්ටාංගික මාර්ගයෙන් සමන්විත වේ. මූලික බෞද්ධ ඉගැන්වීමට අනුව එම මාර්ග පිළිවෙළ පහත පරිදි දැක්විය හැකිය.

පඤ්ඤා
1. සම්‍යක් දෘෂ්ටිය - චතුරාර්ය සත්‍ය නිවැරදිව දැන ගැනීම
2. සම්‍යක් සංකල්ප - කාම, ව්‍යාපාද, හිංසාවෙන් තොර නිවැරදි සිතුවිලි

ශීල
3. සම්‍යක් වචනය - බොරු, කේලම්, නිශ්ඵල, පරුෂ වචනයෙන් තොරවීම.
4. සම්‍යක් කර්මාන්ත - ප්‍රාණඝාත, අදත්තාදාන, වැරදි කාම සේවනයෙන් තොරවීම.
5. සම්‍යක් ආජීවය - කිසිවෙකුට හිංසා නොවන පරිදි ජීවත් වීම.

සමාධි
6. සම්‍යක් ව්‍යායාමය - අකුසල යටපත් කර කුසලය වර්ධනයට ගන්නා උත්සාහය
7. සම්‍යක් සතිය - කායික හා මානසිකව නිවැරදි සිහිය එළඹවා සිටීම.
8. සම්‍යක් සමාධිය - එක් අරමුණක් ඔස්සේ සතිය/චිත්ත ඒකාග්‍රතාවය

බෞද්ධ දර්ශනයට අනුව ආර්ය අෂ්ටාංගික මාර්ගය විදර්ශනා ප්‍රඥාව දියුණු කිරීම අවිද්‍යාව දුරු කිරීමට ඉවහල්වන බවත් එහි ප්‍රතිඵලය නිර්වාණය බවත් ගැඹුරින් ඉගැන්වේ. මේ හැරුණු විට අනාත්මය, කර්මය, පුනර්ජන්මය, ආර්ය මාර්ග හා නිර්වාණය පිළිබඳව බොහෝ ගැඹුරු ක්ෂේත්‍රයක් අධ්‍යයනය කර ධර්ම ඥානය හෙවත් ධර්මාවබෝධය බෞද්ධයෙකු විසින් ලබා තිබිය යුතු වේ. මේ කාර්යයෙන් පරිබාහිරව අදෘශ්‍යමාන බලවේග කෙරෙහි එල්බගත් ජන විශ්වාසවලට දැඩි සේ ආශක්ත වූ බෞද්ධයා විවිධ පුද පූජා වත්පිළිවෙත් පැවැත්වීමෙන් වරදාන අපේක්ෂාව ඉතා ඈත අවධියේ සිට ජනගත වී තිබෙන්නකි. ලෝක ධර්මතාව, හේතුඵලවාදය අවබෝධ කර ගැනීම පසෙකලා ලෞකික ජීවිතයේ නොයෙක් දුක් කම්කටොලු හමුවේ සහනශීලී විසඳුම් සොයන බෞද්ධ ජනයාට මූලික බුද්ධාගමෙන් සෑහෙන්නා වූ පිටිවහලක් නො ලැබේ යැයි ඔවුන් කල්පනා කරන්නට පෙළඹුණි ද යන්න කුකුසකට තුඩුදෙන කාරණයකි. නො එසේනම් ප්‍රාග්-බෞද්ධ ඇදහිලි හා පිදවිලි පිළිබඳ ජන මනස තුළ පැළපදියම් වූ විශ්වාස ශ්‍රැති පරම්පරාවෙන් පැමිණීම හේතුකොට ගෙන ජනප්‍රිය වූයේ ද යැයි සිතිය හැකිය.

නිර්වාණ අවබෝධය පිණිස චතුරාර්ය සත්‍ය අවබෝධ කර ගැනීම කෙරෙහි දැඩි සේ ආශක්ත නොවන බෞද්ධයා ඒ සඳහා මාර්ගකොට ගෙන ඇත්තේ දානමානාදී කුසල කර්ම ඉටු කර කුසලය රැස්කර ගෙන මතු බුදුවේ යැයි ආවේක්ෂිත මෛත්‍රී බුදුන් කෙරෙහි අපේක්ෂාවෙන් සංසාර ගතවීම යි. මෙවැනි වාතාවරණයක් ගොඩනැගී තිබෙන්නේ බෞද්ධ චින්තනය යටපත් කරගත් බමුණු මත විශ්වාස පදනම් වීමෙන් යැයි පිළිගැනීමට බාධාවක් නොමැත. මන්දයත් ධර්මය අවබෝධ කර ගැනීමට මහත් සේ කැපවීමක් නො දරන හුදු බෞද්ධයා ප්‍රාග්-බෞද්ධ යුගයේ සිට පැමිණෙන මෙලොව ජීවිතය සැපවත් කිරීම පිණිස ව්‍යවහාර වත්පිළිවෙතේ කෙරෙහි නැඹුරුව කෙතරම් දැඩිදැයි පිළිගැනීමට හැකි වාතාවරණයක් බෞද්ධ නොවන ඇදහිලිවලින් ප්‍රක්ෂේපණය වේ. එමෙන් ම ජනප්‍රිය ආගම බවට බෞද්ධයින් අතර පුරාණ ඇදහිලි පවත්වා තිබීමෙන් ප්‍රාග්-බෞද්ධ ඇදහිලි ජන විඥානයට කාවැදීම සනාථ කිරීමට එය ප්‍රබලතම හේතු

සාධකයකි. එනම් ගිහි ජීවිතයේ වැදගත් වන ජන්මෝත්සව, නම් තැබීම, ඉඳුල් කටගෑම, හිසකෙස් කැපීම, අකුරු කියවීම, විවාහය ආශ්‍රිත වත්පිළිවෙත්, අස්වැන්න ලබාගැනීම ආශ්‍රිත වත්පිළිවෙත් සංකීර්ණය. දරුවන් අපේක්ෂිත වත්පිළිවෙත්, ජ්‍යොතිෂ්‍යය, ගෘහනිර්මාණ ශිල්පය හා වාස්තු විද්‍යාව, මල්වර චාරිත්‍ර, රෝග සමන වත්පිළිවෙත්, කෙම් ක්‍රම, ග්‍රහඅපල බලපෑම් ව්‍යර්ථකරණය වැනි දෛනික ජීවිතයේ විවිධ වූ කායික මානසික අවශ්‍යතාවලට මූලික බුදු දහමෙන් ප්‍රබල පිටිවහලක් නොලැබේ යන බමුණු මතවාද පෙරටුකොට ගත් චින්තනය මත යන්නා වූ ජන මනස බුදු සමයෙන්ම ප්‍රභවය නොලත් ආගන්තුක විශ්වාස හා චාරිත්‍රවලින් තමන්ට අවශ්‍ය දේ සපුරා ගැනීමට යත්න දැරීම ප්‍රචලිත ජනප්‍රිය වූ තත්වයක් බව ගැමි නාගරික සෑම අංශයකින්ම විවිධ පැතිකඩ ඔස්සේ නිවැරදිව හඳුනාගත හැකිය. මෙම අධ්‍යයනයේ දී අපගේ ප්‍රස්තුතය වන ශාන්තිකර්ම ආශ්‍රිත වත්පිළිවෙත්හි බෞද්ධ දර්ශනයට පටහැණි ලක්ෂණ හඳුනා ගැනීමට අපගේ අවධානය යොමු කරන්නේ ශ්‍රී ලංකාවේ උඩරට පහතරට සබරගමු ඌව නුවර කලාවිය ප්‍රදේශවල ව්‍යාප්ත ශාන්තිකර්ම ආශ්‍රිත එවැනි ජනවිශ්වාස කෙරෙහි ය.

ශ්‍රී ලංකාවේ නන්දෙස පවත්වන සකලවිධ ශාන්තිකර්ම ප්‍රධාන අංශත්‍රයක් යටතේ අධ්‍යයනය කළ හැකිය. ඉන් පළමුවැන්න උඩරට සම්ප්‍රදාය වන අතර දෙවැන්න පහතරට සම්ප්‍රදාය වේ. සබරගමුව සම්ප්‍රදාය තෙවැන්න වන අතර ඌව සහ නුවර කලාවිය පිළිවෙළින් සබරගමුව සහ උඩරට සම්ප්‍රදායන්ට නෑකම් කිය යි. එහෙයින් ඒවා ප්‍රධාන සම්ප්‍රදාය ලෙස ඉදිරිපත් නො කෙරේ. මේ සෑම සම්ප්‍රදායකම පවතින ශාන්තිකර්ම ගත් කල ඒවායෙහි ප්‍රබල වශයෙන් පිදීමට ලක්වෙන අදෘශ්‍යමාන බලවේග අනුව දෙවැදෑරුම් වේ. එනම් යක්ෂ ඇදහිලි ආශ්‍රිත යක්තොවිල් ශාන්තිකර්ම ලෙස ද දේව සමූහයා වෙනුවෙන් කරන දේව තොවිල් ශාන්තිකර්ම යනුවෙන් ද නවග්‍රහ අපල උපද්‍රව ව්‍යර්ථය පිණිස කරන ග්‍රහතොවිල් බලියාග වශයෙන් ද හඳුනාගත හැකි ය. විශේෂයෙන් උඩරට ශාන්තිකර්ම සම්ප්‍රදායේ කොහොඹයක් කංකාරිය මෙහිදී ඉස්මතු නොකරන බව කිව යුතුය. මන්දයත් එහි බෞද්ධ වත්පිළිවෙත්, බෞද්ධ සාහිත්‍ය හා බැඳි කාව්‍ය ඇතුළත් නොවන හෙයින් ය. එමෙන්ම ප්‍රාග්-බෞද්ධ ඇදහිලි සහ බමුණු ආගම් පිළිබඳව ද මෙහිදී දීර්ඝව විග්‍රහයක් අපේක්ෂා නොකරන අතර යාග වත්පිළිවෙත් අතරින් තෝරාගත් නිශ්චිත ප්‍රමාණයක් සාකච්ඡාවට බඳුන් කෙරෙන්නේ මෙම විග්‍රහය සීමාකරගත යුතු වන හෙයින් ය.

මහසොහොන් සමයම, කුමර සමයම, දරුහැව තොවිල් ආශ්‍රිතව පවතින යක්ෂ ආරාධනා කන්නලව් පාඨවල අන්තර්ගතව පවතින්නේ පරිකල්පිත ප්‍රදේශ ආශ්‍රිත උපත් කතාන්තර වේ. ඒ බව පහත සිංහල බසින් නිර්මිත මහ සොහොනාට අඬගසන දිෂ්ටි මන්තරයක කොටසකින් අවබෝධ කරගත හැකිය.

ඕං නමෝ දුරුතු පුර රිවිදින අඳේ නැකතින් සෝවැලි ගජන්තයාට දාව ගජකුම්භකාරිගේ බඩේ උපන් විල් දහසක් පුලුටු විල් දහසක් මවාගෙන එක් අතකට කර්ගයක්... එක් අතකින් ඇතෙකු මරා ලේ රීරි බී ගෙන කටින් ගිණිජල් දහසක් මවා... ඊශ්වර අවතාරයක් මවාගෙන....(කෝට්ටගොඩ, 1998, 113 පිටුව) මෙහි ''දුරුතු පුර'' යනුවෙන් පෙදෙසක් ද අඳේ නැකත නම් වූ නැකතක් ද ''සෙව්වැලි ගජන්තයා'', ගජකුම්භකාරි යනාදී නාම ද නිශ්චිතව

නිගමනයකට එළඹිය නොහැකි අතාර්කික පරිකල්පන බව කිව යුතුය. එපමණක් නොව පුළුටුවිල් දහසක් මවා ගැනීම එක් අතකට ඇතෙකු මරා රුධිරය බීම කටින් ගිණිජල් දහසක් මැවීම යන වදන් අතිශෝක්තිය මවා නූගත් ජනයා තුළ කිසියම් ප්‍රබල විශ්වාසයක් ගොඩනගන්නට යෙදූ අතාර්තික ප්‍රවාද බව වැටහේ. මෙහි සඳහන් මහසොහොන් දිෂ්ටි මන්ත්‍රය දිවයිනේ තවත් පෙදෙසක කියනු ලබන්නේ ඊට හාත්පස උපත් කථාවකි. එහි සන්දර්භය සංක්ෂිප්තව දක්වතොත් ක්‍රිස්තු පූර්ව 161-137 දුටුගැමුණු රජ කල ඔහුගේ යෝධයෙකු වූ ගෝඨයිම්බර යෝධයාගේ බිරිඳට ආවේශ වූ රිටිගල ජයසේන නම් යක්ෂයකු වටා ගෙතුණ ප්‍රකට ජනකථාව මහසොහොන් උත්පත්තියට අයත් ප්‍රවාදය ලෙස පිළිගැනේ. ඒ බව පහත පාඨයෙන් අනාවරණය වේ. ''මහා රූසපුවකින් හෙබි ගෝඨයිම්බර ගේ බිරිඳ කෙරෙහි සිතක් ජයසේන තුළ පහළ වී ආවේශ වූ බව දැනගත් ගෝටයිම්බර, ඇයගෙන් ඉවත් වී තමා සමග සටනට එන ලෙස අභියෝග කළේ ය. එකී අභියෝගයට මුහුණ දුන් ජයසේන ගෝයිම්බර සමග යුද වැදීමේ දී හිස කඳින් වෙන් වූ බවත් එහිදී සෙනසුරු විසින් වලස් හිසක් මවා තැබූයේ, එතැන් පටන් මහසෝනා බවට පත්වූ .....'' යනාදි වශයෙන් (කෝට්ටේගොඩ, 1997, 117 පිටුව) දක්වන පාඨයෙහි ගෝඨයිම්බර- රිටිගල ජයසේන යුද්ධයට සෙනසුරු ග්‍රහයා සම්බන්ධ කිරීමත්, සුසුම්නාව කැඩී ගිය වෙන්වූ හිසකට වලස් හිසක් සවි කිරීම වැනි පරිකල්පිත දේ එක්කර තිබීම හාස්‍ය උත්පාදක මිත්‍යාවකි. එමගින් අදාළ සත්‍ය පුරාවෘත්තයට හානි සිදු වී තිබේ. මන්දයත් ගෝඨයිම්බර සටන පිළිගත හැකි වුවද ඊට හාත්පස වෙනස් හින්දු මතවාද එක්කිරීම මිත්‍යාවට තුඩුදෙන හෙයින් ය. මෙම මහසොහොන් උපත සඳගනා දෙසේ සඳගනා කෝවිලේ සෝමැලි බිසව කුසින් උපන් බව කියයි. එය ප්‍රකට මහසොහොන් පුරාවෘත්තයට අතිශයින් වෙනස් ප්‍රබන්ධයකි. මෙවැනි ප්‍රබන්ධ හෝ එවැනි දේ විග්‍රහ කිරීමෙන් සාපල්‍යතාවයක් අපේක්ෂා කළ නොහැකි යැයි හැඟේ.

මෙකී තොවිල් ආශ්‍රිත රීරි යක්ෂයාගේ උපත් කතාන්දර ද මෙවැනි ම ආකෘතියක් දරයි. රීරි යනු රුධිරය යි. රුධිරය ආශ්‍රිතව හටගන්නා රෝග අතිශය මාරාන්තික තත්වයක් බව පුරාණයේ සිට දැන සිටි බව ඒ හා බැඳි ප්‍රතිකාර ක්‍රමවලින් අනාවරණය වේ. අධිරක්තපාතය, හෘදයාබාධ, අංශභාග, කිරීටක ධමනි අවරෝධය, රුධිර පිළිකාව, රක්ත ප්‍රදරය, අධිරක්තපාතය වැනි රෝග තත්ත්ව ඒ යටතට අයත් රෝග වේ. රුධිර රෝග වළක්වා ගැනීමට අවැසි ස්වස්ථ සංරක්ෂණ ක්‍රමෝපාය රාශියක් රීරියක් වත්පිළිවෙත් ආශ්‍රිතව පවතී. ඒවා පිළිබඳව සලකා බැලීමේ දී රීරි යක්ෂ විශ්වාසය හා බැඳි ශාන්තිකර්ම වූ කලී රුධිර රෝග සමනය කිරීමට අවශ්‍ය යහපත් හෝමෝන සමතුලිතතාවක් ගොඩනගන චාරිත්‍ර වෙසෙසක් ලෙස හඳුනාගත හැකිය. ශාන්තිකර්ම අනුව රීරියක් උපත් කථා සාහිත්‍ය සමීක්ෂාවේ දී ඒ හා බැඳි විවිධ උපත් කථා භාවිතයක් දක්නට ලැබේ. රීරි යක්ෂයා පිලිබඳව බහුලව ප්‍රචලිත උපත් කතාව වනුයේ ''සත් මුහුදින් එතෙර සෞරාෂ්ට්‍ර දේශයේ ලේගල් පර්වතයේ වෙසෙන ලේතාලි බිසව කුස වාලියාට දාව ශනි දින ගුරු හෝරාවෙන් රෙහෙන නක්ෂත්‍ර යෝගයෙන් මවගේ ළමැද පළාගෙන උපන් තනිපළ රීරියක්ෂයා වැදූ මවගේ තනය කඩා රීරි උරන්නට(කොළඹගම ලැයිරිස් අත්පිටපත) පටන්ගත් කල්හි...'' මේ ප්‍රවාදය දිවයිනේ නන්දෙස විවිධ අයුරින් දැකගත හැකිය. ඒවායෙහි දෙවි

දේවතාවුන් සම්බන්ධ කර අවස්ථාවෝචිතව ජන මනස තුළ රීරි යක්ෂයා පිළිබඳ දැඩි විශ්වාසයක් ගොඩනැගීමට එකල ඇදුරන් මාර්ගෝපදේශක කටයුතු කර තිබෙන සෙයක් දැකගත හැකිය. ඒ බව පහත රීරියක් යාදින්නෙන් අවබෝධ වේ.

සත් මුහුදකින් එතෙර - සයිරාෂ්ට්‍ර දේශයේ - රීරිගල් පර්වතේ - ලේ පොකුණු ලේ විලේ - රාහු අසුරිඳු පැමිණ - ඉරමඬල ඇල්ලූ තැන - වැටුණු ලේ කැටිවලින් රීරිවිල මැද උපන් - රීරි යකු යක්ෂණී - දෙවොල් දෙවියන් සමඟ - ලේ නැවෙත් මෙපුර බැස - කළුයකුට එකතු වී.... එසීතා බිසෝ ලඳ - රැගෙන රාවණා රජ - ගල්රථය පදින දා - වැටුණු ලේවලින් උපන් - සමන් දෙවියන් අතින් - අවසරය ගෙන එදා - එවෙසමුණි රජු අතින් - වරම්ලැබ....වඩිගරට ඔඩ්ඩි යකුහට එක්ව ගන්ඩ දොළ...(බෙන්තරගේ, 2009,191-182 පිටු)

ඉහත යාදින්නේ දැක්වෙන පරිදි රාහු අසුරිඳු හා ඉරමඬල අතර සබඳතාවය වත්මන් තාරකා විද්‍යාව අනුව මිත්‍යාවක් වන අතර දෙවොල් දෙවියන් යනු මෙරටට භාරතයේ දෙබොල් දේශයෙන් පැමිණි මහා සාමි, කුඩා සාමි... යනාදී වෙළෙඳුන් සත්දෙනෙකි. මේ පරපුර වර්තමානයේ සීනිගම ප්‍රදේශයේ වාසය කරයි. එබැවින් ඒ පිරිස සමග රීරියක්ෂයා සම්බන්ධ කිරීම ජනප්‍රවාද පටලවා ගැනීමක් යැයි පැහැදිලි වේ. එපමණක් නොව රාමා - සීතා කතා පුවත ප්‍රාග්-බෞද්ධ යුගයටත් වසර  දහස් ගණනක් ඉහත යැයි බොහෝ ප්‍රවාදවලින් පිළිගත් මතයකි. එබැවින් රාවණා රජුගේ ගල් පහුර හා රීරි යක්ෂයා සම්බන්ධ වීම මෑතකදී කළ ප්‍රබන්ධයක් යැයි පිළිගත හැකිය. සමන් දෙවියන් පිළිබඳ අනාවරණය වන්නේ ක්‍රිස්තු පූර්ව හයවන සියවසේ බුදුන් වහන්සේගේ කාලයේ දී ය. එකල රීරියක්ෂ ප්‍රවාදයක් ගැන මූලාශ්‍රවලින් අනාවරණය නොවේ. ඒ හැරුණුවිට රීරි යක්ෂයා සම්බන්ධ එකිනෙකාට පටහැණි උපත්කථා ප්‍රවාද දක්නට ලැබේ. ඒවා පිළිවෙළින් පහත දක්වා ඇත.

1. වාලියාට දාව ලේතාලි කුස ඉපදීම, 2. ඇලිකිඹුලාගේ හෘදය පළාගෙන ඉපදීම, 3. ලේවිල් රාක්ෂිගේ දිවෙන් ලේ බින්දුවෙන් ඉපදීම, 4. දළ රීරි බිසවගේ කුස ඉපදීම, (බෙන්තරගේ, 2009,52-53 පිටු) 5. හනුමන්තා දේසේ හනුමන්තා කුමරිගේ දකුණු උරෙන් ඉපදීම, 6. සයිරාස්ට නිරිඳුන් රනකපල් බිසව කුස ඉපදීම, 7. මිනිමාල බිසව කුසින් ඉපදීම, 8. අවකුම්භකාරීගේ කුසින් ඉපදීම, 9. කුවේණියගේ වීදුරු දිව කැපූ රුධිරයෙන් ඉපදීම, 10. සමන් දෙවියෝ අයිරාවණ හස්තියාට ඇන්න කඩුවේ අග රැඳුණු ලේ බිංදුවෙන් ඉපදීම (කුමාරතුංග, 2017, 178-185 පිටු) යනාදි වශයෙන් තවදුරටත් හනුමන්තා රුසියාට දාවීම, රීරි මාල රුසියාට දා වීම, ඔරුමාල රුසියාට දා වීම, උරිරුමාල රුසියාට දාවීම, (''දාවීම'' යනු ජාතක වීම යන අදහස කන්නලව්වල යෙදෙන ආකාරය යි) යනාදී වශයෙන් දැක්වෙන උපත් කතාවල සඳහන් පරිදි ඒවායේ පසුබිම නිරීක්ෂණයේ දී අනාවරණය වන්නේ එක් එක් යුගවලට ආවේණිකව පැවතියා වූ ජනප්‍රියතම ප්‍රබල විශ්වාස සමඟ රීරියක් උපත් කථාව ප්‍රබන්ධ වී පැවත ආ විලාසය යි. එබැවින් එහි ගැබ්වෙන මිත්‍යාව අතිශයින් පුළුල් පරාසයකට විහිදෙයි. රීරියක්ෂ අදෘශ්‍යමාන බලවේගය විවිධ උපත් කථාවලට සම්බන්ධ කිරීමට යැමක් අනුව එහි විශ්වසනීයත්වය පළුදු වී තිබෙන සෙයක් මෙයින් අනාවරණය වේ.

ඉහත අප විසින් දක්වනු ලැබුවේ යක්ෂයින් දෙදෙනෙකුගේ පුරාවෘත්ත පමණි. මේ හැරුණු කල කලු යකා, කලු කුමාරයා, අබිමාන යකා, තොටේ යකා, පිල්ලු යකා... වැනි යක්ෂ ප්‍රබන්ධවල ඉහත දක්වන ලද ආකාරයේ පරස්පරතා දැක ගත හැකිය. මේ සමස්තය අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි වන්නේ භාරතීය බහු දේවවාදය හා සම වූ ජනප්‍රවාද සම්මිශ්‍රිත විලාසය ලංකාවේ යක්ෂ විශ්වාසවල ද එලෙසම පවතින බව ය. එක් එක් කාල වකවානුවල ජනප්‍රිය වූ දෙවිවරු යක්ෂ විශ්වාස සමග බද්ධකර ගැනීමට එකල අතරමැදියන් හෙවත් යකැදුරන් කළ උපක්‍රම අනුව නිර්මාණය වූ මෙවැනි උපත් කථා මිත්‍යා ප්‍රබන්ධ ලෙස පිළිගැනීමට සිදුව තිබෙන බව ප්‍රකාශ කළ යුතු වේ.

බෞද්ධ දර්ශනයට අනුව යමක් පිළිගත යුත්තේ හේතුඵල දහම අනුව යැයි නවීන විද්‍යාව ද ඉතා නිරවුල්ව ඔප්පු කර තිබේ. බුදු වදනට අනුව මෙවැනි උපත් කථා බෞද්ධයින් විමසුමට ලක් නොකරන්නේ මන්ද? යැයි සැක පහළ වන්නේ ය. කාලාම සූත්‍රයෙහි දැක්වෙන පරිදි නුවණැත්තෙකු කිව්ව පමණින් හෝ පොදු ජනමතය නිසා හෝ පුරාණ වේද ග්‍රන්ථවල ලියා තිබුණ පමණින් හෝ දෙවියන්ගෙන් ආරම්භ වූවක් යැයි පිළිගත් පමණින් හෝ යමෙකු තරයේ විශ්වාස කළ පමණින් හෝ කිසිවක් විශ්වාසය නො කළ යුතු බවත්, හේතුව සහ ඵලය නිවැරදිව සනාථ කරගෙන හරිහැටි වටහාගතහොත් සත්‍ය අවබෝධකරගෙන නිගමනයකට එළඹීම නිවැරදිතම ක්‍රමය බව බුදුන් වහන්සේ දේශනා කළහ. එබැවින් ශාන්තිකර්ම ජනප්‍රවාදවල පරස්පරතා ගැළපීමට යෑමෙන් බෞද්ධ දර්ශනයට පටහැණි ව්‍යාකූලතා රැසක් මතුවන බව පිළිගත යුතුව ඇත.

සෑම සිංහල යාගයක්ම ආරම්භවන්නේ බුදුන් වහන්සේට කරනු ලබන නමස්කාර පාඨයකිනි. බලියාගවලදී, ''නමෝ බුද්ධාය දූරවේණ - නමෝ ධම්මා යථායිනී නමඃසංඝාය මහාතේන - ත්‍රිභෞපි සතතං නමඃ නමඃ'' (කුමරතුංග, 2006, 170-174 පිටු)

ත්‍රිවිධ රත්නයට පහන් තැබීම, දෙවියන්ට ආරාධනා කිරීම, බුද්ධ සත්‍ය ක්‍රියාව ගායනය.... යනාදි වශයෙන් එහි සමස්ත බුද්ධ වන්දනාව ප්‍රකට කරයි. යක් තොවිල් යාගවලද පළමුව තුනුරුවනට පහන් දැල්වීම හා නමස්කාර පද්‍ය ගායනය මෙන්ම සියලු ආශිංසනාත්මක ගද්‍ය, පද්‍ය මන්ත්‍රවල තෙරුවන් ගුණ දත හැකිය.

උතුම් බුදු රුවනේ - ලොව්තුරු දහම් සරණේ
සමග සඟරුවනේ - සදා වඳිනෙම් මෙතුන් සරණේ

සාතාගිරෝ නමෝ යක්ඛෝ - තස්සච අසුරින්දදෝ
භගවතෝ මහාරාජා - සක්කෝ අරහතෝ තථා
සම්මා සම්බුද්ධ බ්‍රහ්මණෝ - ඒතේ පංච පතිට්ඨිතා
ඒවං ඒතේහි වන්දේහි - ප්‍රාණමාමි පිනේන්ද්‍රියං

(කෝට්ටගොඩ, 1998, 67 පිටුව)

යනාදි වශයෙන් ශාන්තිකර්ම ආරම්භයේ සිට අවසානය තෙක් වරින්වර බුදුගුණ සහිත ගායනා අන්තර්ගත වේ. එමෙන්ම මන්ත්‍රවල ද 'ඕං නමෝ' යනුවෙන් බුදුන්ට නමස්කාර කිරීම බහුලව දක්නට ලැබෙන අතර අභිසම්භිධානය, බුද්ධමාලාව, වෙසමුණි සැරය.. වැනි මන්ත්‍ර 'බුද්ධ මන්ත්‍ර' ලෙස එහි අන්තර්ගතයෙන් නිසැකවම අවබෝධ කර ගත හැකිය. යාග සාහිත්‍යයේ අන්තර්ගත ද්‍රවිඩ, තෙලිඟු, කල්ලු, ආන්ද්‍ර, සහ සිංහල නොවන අනෙකුත් භාෂාවන්ගෙන් නිර්මිත මන්ත්‍ර හැරුණු කල්හි සෙසු පද්‍ය, සන්න, සැහැලි, ගද්‍ය පාඨ බෞද්ධ කාව්‍ය සම්ප්‍රදාය ගුරුකොට රචනා වූ විලාසයක් විශද කෙරේ. විශේෂයෙන් **වෘත්තමාලය, වෘත්තමාලාඛ්‍යාව** වැනි ශාස්ත්‍රීය කාව්‍ය ප්‍රබන්ධ මූල ග්‍රන්ථවල ඇතුළත් මත්තේභ වික්‍රීර්ඩිර්ත වෘත්තය, ශාර්දූල වික්‍රීර්ඩිර්ත වෘත්තය වැනි පද්‍ය ප්‍රබන්ධ වෘත්ත ක්‍රම ශාන්තිකර්ම සාහිත්‍ය රචනයට යොදාගෙන තිබෙන බව( කුමාරතුංග, 2006, 23-25 පිටු) සනාථ වෙ. එමෙන්ම බෞද්ධ කාව්‍ය සඳහා මූල ග්‍රන්ථයක් වූ එළුසඳැස් ලකුණ ග්‍රන්ථයේ පද්‍ය ප්‍රබන්ධ කලාව එලෙසම භාවිත කර තිබෙන බව පැහැදිලිව හඳුනාගත හැකිය. යාග ගී රචනා කරන ලද්දේ සංස්කෘත පාලි භාෂාව සහ ඡන්දස් ශාස්ත්‍රය මැනවින් හදාරණු ලැබූ සඟ පරපුර සහ ඔවුන්ගේ ශිෂ්‍යවරයෝ විසින් බව සක්සුදක් සේ අනාවරණය වේ. එබැවින් යාග සාහිත්‍ය බෞද්ධ නැඹුරුවකට නිතැතින් ම පත්ව ඇති බවට ප්‍රතිකූල තර්කයක් යෙදිය නොහැක. ඒ සඳහා කදිම නිදසුන වන්නේ සමස්ත බලියාග සාහිත්‍යය යි. කුමරතුංග, 2006, **සබරගමු බලියාග පිළිවෙළ** නම් වූ කෘතියේ සියලු අන්තර්ගතය ඒ බව පසක් කරයි. ඉන් උපුටාගත් පද්‍ය කිහිපයක් පහත දැක්වේ.

ශ්‍රීමත් චිත්‍රංසු වංසයාම් මරපත ජවලිතම් - තුල්‍ය සුක්ලාංසු හිම්හම්
වන්දේහන්තං මුනීන්ද්‍රං ත්‍රිභුවන මහිතස් - ස්වර් පීනේන්ද්‍රෝව තාත්වඃ (චින්තාමනී ශාන්තිය)
පවර අපෙ මුණි සතට කුළුණුව බුදුව වැඩ සිට ලොව්තුරා
ඉවර කර දොස ඒ අනුහසයෙන් කියමි හෝර කවි කරා (හෝරාහත පද්‍ය)
තෙරුවන් වැඳ පවර - කියමි නවග්‍රහ පුවත මුල්කර (රාශි දොළස පද්‍ය)
එදා මුණි සඳ - දෙණ්න බලි වදාහලේ මුණි සඳ (පංතිස් බලි කවි)

එමෙන් ම දස පාරමිතාව, සවනක්ගනය, දස පිරිත, බුදුගුණ සෙත් අලංකාරය, ලෝකරත්න මාලය, මුණිගුණ රත්න මාලය, රංපඬුරේ ශාන්තිය, විශාලා ශාන්තිය, පිරිත්හුයේ කවි, ජාතකරත්න මාලය, ශාන්තිරත්න මාලය, නවගුණ ශාන්තිය යනාදී වශයෙන් ඍජුවම බුදුන් වහන්සේගේ ගුණානුභාවයෙන් ආශිංසනාත්මක පද්‍ය සමුදායක් බලියාගයේ හඳුනාගත හැකිය. බලියාගය වූ කලී සෞන්දර්යාත්මක බෞද්ධ ආධ්‍යාත්මික වන්දනාවක් යැයි කීමට බාධාවක් නොමැත. එහෙත් දිවයිනේ ඌව සහ නුවරකලාවිය බලියාග අතර නොදැහැමි ඇදහිලි සහ හින්දු දේවවාදය අන්තර්ගතව පවතින බව හඳුනාගත හැකිය. අයියනායක දෙවියන් පිදීම, පුල්ලෙයාර් හෙවත් ගණ දෙවියන් පිදීම, සත්ත්ව ලේ පුළුටු ගොඩ දිය මස්, රා අරක්කු සහිත පිටමුරේ ගොටුදීම, කඩවර සහ කම්බිලි ගොටු මාලාව දීම, උඩැක්කි වාදනය, පැදුරුමාලය, මරුදැපවිල්ල වැනි හින්දු දේව වන්දනය සහ යක්තොවිල්වල චාරිත්‍ර අන්තර්ගතව තිබීම පූර්ව කී කාරණයට ඉවහල්වන සාධක (දිසානායක, 1996, 9-26 පිටු) ලෙස දැක්විය හැකිය. මෙහි පැදුරු

මාලය සහ මරුදැපවිල්ල යක්ෂාවේශයට අයත් අනුභූති ලද පිරිසක් විසින් බලියාග සම්ප්‍රදායට එක්කර තිබෙන බව වටහා ගත හැකිය. එමෙන්ම ප්‍රේත පිදවිල්ලට අදාළ රා අරක්කු කංසා දීම පිළිබඳව එවැන්නන් විසින් තත් යාග ක්‍රමයට මිශ්‍රකරන ලද බව ද පැහැදිලි වේ. ගණේෂ්වර පිදීම බොහෝ බෞද්ධ රටවල ප්‍රබලව ම ව්‍යාප්ත වී තිබෙන දේව වන්දනයකි. එය සෘජුව ම නුවර කලාවිය සහ ඌවේ ජනයා තම ජනප්‍රිය චාරිත්‍ර අතරට මිශ්‍රකොට ගෙන තිබීම විශේෂ කොට සැලකිය හැකිය. එමගින් බලි යාගය ආශ්‍රිතව ද බෞද්ධ දාර්ශනික ආධ්‍යාත්මික වන්දනයට පටහැණි ලක්ෂණ පවතින බව හඳුනාගත හැකිය.

මේ හැරුණුවිට බෞද්ධ වත්පිළිවෙත්වල අන්තර්ගත ආමිස පූජා පිළිවෙත් ක්‍රම ඒවායෙහි දැකිය හැකිය. පහන් දැල්වීම, සුවඳ ධූප දල්වීම, මල් වර්ග පිදීම, පංචශීලය සමාදන්වීම, බුද්ධ වන්දනාව, පැන් පූජාව, ආහාර පූජාව, සාතාගිර සන්නය හා කවි ගැයීම, නමස්කාර පාඨ ගාථා ගැයීම, දානය පිළියෙල කර පිදීම, ඥාතීන්ට පින්දීම, දෙවියන්ට පින්දීම... මගින් බෞද්ධ ආමිස පූජා එලෙසම ශාන්තිකර්මවල අන්තර්ගත බව පැහැදිලි වේ. එසේ වුවද ප්‍රාග්-ඇදහිලි අතර පැවති මළයකුන් පිදීමේ චාරිත්‍ර යාගවල බහුලව හඳුනාගත හැකිය. සේරි වාදනය, මුරුතැන් පිදීම, අතොරකරුවන් පේ කිරීම, තොට පේ කිරීම, ආභරණ වැඩමවීම, ආභරණ නානුමුර කිරීම, බත් හත්මාලු පිදීම, කෝල්මුර ගැයීම, කඩවරයින් පිදීම, වැදි යකුන් පිදීම, කප් සිටුවීම, මල පේ කිරීම, වීදිමාලාව ගැයීම, විවිධ අන්දමේ යකුන්ට බලිදීම, රුධිරය පිදීම, පුළුස්සන ලද මස් පිදීම, පුළුස්සන ලද මත්ස්‍යයින් පිදීම, කොච්චි මිරිස් කොළ පිදීම, විලක්කු ගැසීම, පන්දම් නැටීම, බිත්තර පිදීම, හින්දු දෙවිවරු පිදීම, වේශ නිරූපණය විවිධ අන්දමේ රංගවස්ත්‍රාභරණ දැරීම, පොල් ගැසීම, කුකුළා කැප කිරීම, කුකුළු මූර්තුව, බිල්ලේ පාලිය, විවිධ අන්දමේ බලිබිලි සහිත පිදවිලි දීම, යකුන් සහ දෙවියන් විෂයෙහි ඇපවීම, පඬුරු බැඳීම, බලි වර්ග අඹා පාවාදීම, අටකොනේ යක්ෂයින්ට ආරාධනා කිරීම, අටකොනේ දැපීම, දරුහැව සොහොනට ගෙන යාම, සොහොන්මත උඩුකුරුව වැතිරී මන්ත්‍ර ජප කිරීම, ආතුරයා පරල කිරීම, දුම්මල වරම ගැනීම, වාහල නැටීම, දෙවොල් ගොඩ බැසීම, ගිනි සිසිල, රාමා මැරීම, දෙකොන විලක්කුව නැටීම, පූනාව බිඳීම, ඇත්බන්ධනය, මී බන්ධනය, පුරාලයේ දැපීම, මරුවාට අඬගැසීම, මරුපැදුරේ දැපීම, දිෂ්ටි මන්ත්‍ර කීම, වස්දොස් දුරු කිරීම... යනාදි වශයෙන් බෞද්ධ ආමිස පූජාවලට හාත්පසින් ප්‍රතිකූල වූ වත්පිළිවෙත් සිංහල ශාන්තිකර්ම තුළ පවතී. සත්ත්ව බිලිදීම හා බැඳි චාරිත්‍ර ලෙස කුකුළා කැප කිරීම සහ කුකුළාගේ කරමලය කඩා ලේ ගොටු රාශියක් පිදීම බෞද්ධ වත්පිළිවෙත්වලට පටහැණි වූවකි. එමෙන් ම ගෙරි ඔලුවේ තීන්දුව වැනි මළ සතුන්ගේ ශීර්ෂ රැගෙන වත්පිළිවෙත් කිරීම, මිනිස් හිස් කබල් භාවිතයෙන් විත තීන්දු කැපීම, ගොපලු සමයම සහ ඉර මුදුන් සමයම වැනි සබරගමුවේ යාගවල දැකගත හැකිය. බිත්තර බැඳීම, බිත්තර කටුවේ බත් පිසීම හා ඒවා පිදීම යක් තොවිල්වල අන්තර්ගත නොදැහැමි ඇදහිල්ලකි. ගොඩ දිය මස් හෙවත් සත්ත්ව මාංශ පුළුස්සා පිදීම, රා, අරක්කු කංසා, සෙම්, සොටු, මළපහ පිදීම ප්‍රේත තොවිල්වල විශේෂ චාරිත්‍ර වේ. ඒවා ද නිවැරදි ආධ්‍යාත්මික වන්දනාවලට පටහැනි සිරිත් ය. බිල්ලක් වෙනුවට ප්‍රතිරූපයක් අඹා යකුන්ට කැප කිරීම රීරිබලිය, කටිනා බලිය, යක්ෂගිරි බලිය, මදන යක්ෂ බලිය, රතිකාම බලිය, මහසොහොන් බලිය, කලුකුමාර බලිය වැනි යාග අවස්ථාවලදී

භාවිත ප්‍රධානතම නොදැහැමි ඇදහිල්ලක් වේ. රෝග හා රෝගී විධි පරීක්ෂාවෙන් නිවැරදිව රෝග නිධානය අවබෝධ කොට නො ගෙන මෙවැනි වත්පිළිවෙත් කෙරෙහි ආශක්තවන කල්හි ගැමි, නාගරික බෞද්ධ හා අබෞද්ධ සියල්ලෝ නිවැරදි දැක්මට පිටුපා සිටින සෙයක් හඳුනාගත හැකිය. ධර්මාවබෝධය ලැබූ අයෙකුට මෙවැනි වත්පිළිවෙත් මුළුමනින්ම නිරර්ථක බව මෙහි දී හඳුනාගත හැකියි. මන්දයත් ඉහත චාරිත්‍රවල අන්තර්ගතය පරීක්ෂාවේදී රෝගයට අදාළත්වය යාගවිධි සමග පරස්පරවන බව ඔවුනට පැහැදිලි වන හෙයිනි. සංස්කෘතිකමය වශයෙන් සමාජයක හැඩගැසී පවතින බලවත් වූ විශ්වාස හමුවේ ඒවායෙන් සහනයක් අපේක්ෂා කිරීමේ දැඩි උපාය මාර්ග කෙරෙහි පිහිට යදින උදවිය එවැනි පුද පූජා කිරීමෙන් තමන්ට විපත් පමුණුවන අදෘශ්‍යමාන බලවේග සතුටු කළ යුතු යැයි ද එසේ කළ විට ඔවුන් තමන් කෙරෙන් ඉවත්ව යන බවට පවතින විශ්වාසය ද ඔවුනට මහත් සහනකාරී පිටිවහලක් ලබාදෙයි. දරුහැව සොහොනට රැගෙන යන තොවිල් චාරිත්‍රවලදී ආතුරයා වෙනුවට යකුන්ට ඇදුරා කැපවෙන බව කවි කන්නලව් හා කැපකරන මන්ත්‍රවලින් ආතුරයාට සන්නිවේදනය කරයි. මෙහිදී ආතුරයාගේ යටිසිතේ තැන්පත්ව පවතින තමාගේ කයට වැදී සිටින භූතයා පිළිබඳ බිය පහවීමෙන් සිතට දැනෙන සහනයත් සමඟ අක්‍රමවත් වූ සුවකරන හෝමෝන ක්‍රියාකාරී වී රුධිරයේ ඇතිවන රසායනික විපර්යාස ශුභ අතට හැරීමක් ඉන් සිදුවන බව පැහැදිලි කාරණයකි. එබැවින් මෙවැනි වත්පිළිවෙත් අවශ්‍ය වූ පිරිසක් සමාජයේ වෙසෙයි. ඔවුන් යම්දිනක ධර්මාවබෝධය ලබත් ද එකල්හි එම යාග නිරර්ථක යැයි පිළිගනු ලබති. කෙසේ වුවද මෙම යාගවලින් කිසියම් පාර්ශ්වයකට ශුභදායක සෞභාග්‍ය ළඟා කර ගත හැකි බවට විශ්වාස සම්මුති සංකල්පයක් ලොව පවතී. ඒවායෙහි පවතින නොදැහැමි වත්පිළිවෙත් බෞද්ධ ආධ්‍යාත්මික පිළිවෙත් සමග මුසුවූ මිශ්‍ර ගැමි ආගමික ස්වරූපයක් යාග ක්ෂේත්‍රයේ ගැබ්ව පවතින බව මෙහිදී අනාවරණය කරගත හැකි විය.

**සමුද්දේශ**


බෙන්තරගේ, ලයනල්, (2009), රීරියක් සංකල්පය සහ සමාජය, මරදාන.

බෙන්තරගේ, ලයනල්, (1998), කළුකුමාර යාග පිළිවෙළ, කොළඹ.

දිසානායක, මුදියන්සේ, (1996), කොහොඹා යක් කංකාරිය සහ සමාජය, කොළඹ.

කෝට්ටගොඩ, ජයසේන, (1998), මැණික්පාල ශාන්තිය හෙවත් සූනියම් කැපිල්ල, බොරලැස්ගමුව.

කුමරතුංග, සමන්, (2017), පුරාණ සබරගමුවේ දාරක වත්පිළිවෙත්, කොළඹ.

- රත්නපුර, නිවිතිගල, කොළඹගම පහළකන්දේ පී. ඩබ්ලිව් ලැයිරිස් යකැදුරාගේ පුස්කොළ අත්පිටපත් පරිශීලනය (මේ හැරුණුවිට විවිධ ප්‍රවේණිවල පුස්කොළපත් 40කට අධික සංඛ්‍යාවක් මෙහිදී අධ්‍යයනය කළෙමු.)
- වර්ෂ 1986 සිට ශාන්තිකර්ම ශිල්පියෙකු, බෙර වාදන ශිල්පියෙකු සහ නර්තන ශිල්පියෙකු ලෙස මේ දක්වා අප කළ කාර්යය මෙහිදී පරිකල්පනය කොට ගතිමු.